# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## නිදහස් අධ්‍යාපන අයිතිවාසිකම්

**ශ්‍රී ලංකාවේ සියලු ම දරුවන්ට නිදහස් අධ්‍යාපනයට ප්‍රවේශයක් ලබා දීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අකිල විරාජ් කාරියවසම් මහතා විසින් 2011 පෙබරවාරි මස 08 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2011 ජනවාරි මස 17 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[69 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 11.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

# නිදහස් අධ්‍යාපන අයිතිවාසිකම්

## ශ්‍රී ලංකාවේ සියලු ම දරුවන්ට නිදහස් අධ්‍යාපනයට ප්‍රවේශයක් ලබාදීම සඳහා වූ පනතකි.

යටත් පිරිසෙයින් ද්විතීයික මට්ටම දක්වා වත් ශ්‍රී ලංකාවේ සියලු ම දරුවන්ට නිදහස් අධ්‍යාපනයක් ලබා දීම තහවුරු කිරීම අවශ්‍ය වී ඇති බැවින්: පූර්විකාව.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2011 අංක    දරන නිදහස් අධ්‍යාපන අයිතිවාසිකම් පනත වශයෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

### නිදහස් සහ අනිවාර්ය අධ්‍යාපනය ලබා ගැනීමේ අයිතිවාසිකම

**2.** (1) වයස අවුරුදු පහේ සිට සියලු ම දරුවන්ට නියමිත පරිදි ඔහුගේ අධ්‍යාපනය සම්පූර්ණ වන තුරු නියමිත පාසලක නිදහස් අධ්‍යාපනය ලබා ගැනීමේ අයිතිවාසිකම තිබිය යුතු ය. දරුවකුට නිදහස් හා අනිවාර්ය අධ්‍යාපනය ලබා ගැනීමේ අයිතිවාසිකම.

(2) (1) වැනි උපවගන්තියේ අරමුණු වෙනුවෙන්, දරුවකු යථා පරිදි සිය අධ්‍යාපන කටයුතු නිම කෙරෙන තුරු නීතියෙන් අනුමත ගෙවීමක් හැරුණුකොට වෙනත් කිසිම වර්ගයක ගෙවීමකට, ගාස්තුවකට හෝ වැය බරකට යටත් නොවිය යුතු ය.

**3.** (1) කිසියම් පාසලක සිය අධ්‍යාපන කටයුතු නිසි පරිදි කිරීම පිණිස අවස්ථාව නොලබන අවස්ථාවක දී, යෝග්‍ය බලධාරියකු විසින් නිකුත් කරනු ලබන කිසියම් රෙගුලාසියකට හෝ නියෝගයකට අනුකූලව, වෙනත් කිසියම් නියමිත පාසලකට ස්ථාන මාරුවක් ලබා ගැනීමට දරුවකුට අයිතිවාසිකම හිමිවිය යුතු ය. වෙනත් පාසලකට ස්ථාන මාරුවක් ලබාගැනීමේ අයිතිවාසිකම.

(2) කවර වූ හෝ හේතුවක් මත දරුවකු පාසලකින් පළාත තුළ හෝ පිටත පිහිටි පාසලකට මාරු වීමට අවශ්‍ය වූ අවස්ථාවක දී, යෝග්‍ය බලධාරියා විසින් නිකුත් කරනු ලබන කිසියම් රෙගුලාසියකට හෝ නියෝගයකට අනුකූලව වෙනත් කිසියම් නියමිත පාසලකට ස්ථාන මාරුවක් ලබා ගැනීමට දරුවකුට අයිතිවාසිකම හිමිවිය යුතු ය.

2—PL 005400—330 (2010/12)

### යෝග්‍ය බලධාරියාගේ හා දෙමව්පියන්ගේ යුතුකම්

යෝග්‍ය බලධාරියාගේ යුතුකම්.

**4.** 1993 අංක 8 දරන පාසල් සංවර්ධන මණ්ඩල පනතේ ද, 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ ද, 2005 අංක 16 දරන සුනාමි (විශේෂ විධිවිධාන) පනතේ II වැනි කොටසේ ද දරුවන්ට අදාළ වන තරමට 2005 අංක 34 දරන ගෘහස්ත ප්‍රචණ්ඩත්ව පනතේ ද විශේෂයෙන් ම මෙහි උපලේඛනයේ විස්තර කර ඇති අන්දමට 1991 ජූලි 12 වැනි දින ශ්‍රී ලංකාව විසින් අත්සන් තබන ලද ළමයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මතයේ ද විධිවිධානවල බලපැවැත්ම පූර්ණ වශයෙන් ම ක්‍රියාත්මක කරන අතරතුර යෝග්‍ය බලධාරියා,

(අ) (ආ) ඡේදයේ නිශ්චිත ව සඳහන් පරිදි දරුවාගේ අධ්‍යාපනය නිමා කරන තුරු සෑම දරුවකුට ම වයස අවුරුදු පහේ දී ආරම්භ කරමින් නියමිත පාසලක නිදහස් අධ්‍යාපනයක් ලබා දිය යුතු ය.

එසේ වුව ද, අදාළ පරිදි, දරුවකුගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් නිශ්චිත පාසලක් නොවන වෙනත් පාසලකට දරුවකු ඇතුළත් කරනු ලැබූ අවස්ථාවක දී එවැනි දරුවකුට හෝ අදාළ පරිදි දරුවාගේ දෙමව්පියන්ට හෝ භාරකරුවකුට හෝ එවැනි වෙනත් පාසලක දරුවා අධ්‍යාපනය ලබා ගැනීමට වැය කරන මුදල් ප්‍රතිපූරණය කරවා ගැනීමට ඉල්ලීමක් කිරීමට හිමිකම් නොතිබිය යුතු ය;

(ආ) 5 (1) වැනි උපවගන්තියේ සඳහන් කර තිබෙන කිසියම් ප්‍රසිද්ධ විභාගයක දී සාර්ථක ලෙස සුදුසුකම් ලැබීමේ කොන්දේසියට යටත්ව වයස අවුරුදු පහක් සම්පූර්ණ කළ සියලු ම දරුවන්ට දහතුන්වැනි ශ්‍රේණිය දක්වා නිදහස් අධ්‍යාපනය ලබා දීමටත්;

(ඇ) සියලු ම දරුවන් පාසලට ඇතුළත් කරවා ගැනීමත්, පාසලට පැමිණීමත්, අධ්‍යාපනය සම්පූර්ණ කිරීමත් සහතික කිරීමටත්;

(ඈ) 2 වන වගන්තියේ අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස රජයේ පාසලක් තිබීම සහතික කිරීමටත්;

(ඉ) පාසල් ගොඩනැගිලි, ගුරු මණ්ඩලයක් සහ ඉගෙනුම් උපකරණ ඇතුළු යටිතල පහසුකම් සැපයීමටත්;

(ඊ) ගුරුවරුන්ට පුහුණු පහසුකම් ලබා දීමටත්,

බැඳී සිටියි.

උසස් කිරීමේ පොදු විභාගය.

**5.** (1) අධ්‍යයන ක්‍රියාවලියේ ඊළඟ වර්ෂයට පිය නැඟීමට අවශ්‍ය සුදුසුකමක් වශයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන ඕනෑම ප්‍රසිද්ධ විභාගයක් ගැසට් නිවේදනයක් මගින් නම් කිරීමට අමාත්‍යවරයාට හැකි ය.

(2) මේ පනත යටතේ සාදන ලද රෙගුලාසියකට අනුකූලව අමාත්‍යවරයා විසින් සපයනු ලබන අන්දමේ අධ්‍යාපනයක් ලබාගැනීමේ අයිතිවාසිකම ආබාධිත දරුවකුට ද තිබිය යුතු ය.

මූල්‍ය වගකීම් හවුලේ භුක්තිවිඳීම.

**6.** (1) මේ පනතේ විධිවිධාන ක්‍රියාවට නැංවීම සඳහා අරමුදල් සපයා ගැනීමේ වගකීම දැරීමට යෝග්‍ය බලධාරීන්ට හැකිවිය යුතු ය.

(2) 2012 වර්ෂයේ පටන් මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිණිස සියලු ම යෝග්‍ය බලධාරීන්ට අවශ්‍ය සමස්ත ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් පිළිබඳ පස් අවුරුදු ඇස්තමේන්තු වාර්තාවක් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය සහිතව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අමාත්‍යවරයා පියවර ගත යුතු ය.

(3) අවස්ථාවෝචිත පරිදි පාර්ලිමේන්තුවට හෝ පළාත් සභාවට අයවැය ලේඛනය ඉදිරිපත් කරන අවස්ථාවේ දී ඉහත කී ඇස්තමේන්තු අනුමත කරන බවට මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයක් කළ යුතු ය.

(4) මුදල් විෂයය භාර අමාත්‍යවරයාට කලින් කලට මේ වාර්තාව සංශෝධනය කළ හැකි ය.

(5) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරනු ලැබීම සඳහා අරමුදල් සැපයීමට පළාත් විධායකයට හැකිවන පරිදි එකී පළාත් විධායකයට කිසියම් අතිරේක සම්පත් සැපයිය යුතු ද යන්න විමසා බලන ලෙස මුදල් කොමිෂන් සභාවට නියෝග කිරීමට ජනාධිපතිවරයාට හැකි ය.

(6) සියලු ම පළාත් විධායකයන් ඉහත සඳහන් උපවගන්තිය යටතේ එකී පළාත් විධායකයට රජය විසින් සපයන ලද මුදල් ප්‍රමාණයන් එහි වෙනත් සම්පත් සමඟ සැලකිල්ලට භාජනය කරමින් මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අරමුදල් සැපයීමේ වගකීම දැරිය යුතු ය.

**දෙමව්පියන්ගේ හා භාරකරුවන්ගේ වගකීම.**

**7.** නියමිත පාසලක පාසල් අධ්‍යාපනය ලබාදීම පිණිස අවස්ථාවෝචිත පරිදි තමන්ගේ දරුවා හෝ රක්ෂිතයා හෝ ඇතුළත් කිරීම හෝ ඇතුළත් කරවා ගැනීම සියලු ම දෙමව්පියන්ගේ හෝ භාරකරුවන්ගේ යුතුකම විය යුතු ය.

## පාසල්වල හා ගුරුවරුන්ගේ වගකීම

**ගාස්තු අය නොකළ යුතු බව.**

**8.** දරුවකු ඇතුළත් කරගැනීමේ දී කිසිම පාසලක් හෝ පුද්ගලයකු හෝ කිසිදු ගාස්තුවක් එකතු නොකළ යුතු ය.

**අමාත්‍යවරයාගේ කාර්යය.**

**9.** (1) පාසල් වැඩකටයුතු, ජාතික දින උත්සව, ආගමික උත්සව සහ විදේශීය රාජ්‍ය අමුත්තන් පිළිගැනීමේ උත්සව හැරුණු කොට වෙනත් කිසිදු ක්‍රියාකාරකමක් සඳහා ශිෂ්‍යයන් යොදා ගැනීම තහනම් විය යුතු ය.

(2) ඊළඟ වර්ෂයේ විභාග පැවැත්වීමට නියමිත දින ඇතුළත් පාසල් දින දර්ශනය සෑම වර්ෂයක ම ඔක්තෝබර් 31 වැනි දිනට පෙර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

(3) අධ්‍යයන වර්ෂයකට අයත් අවම වැඩ කරන දින ගණන අමාත්‍යවරයා විසින් නියම කළ යුතු අතර එම දින ගණන දින 180ට අඩු නොවිය යුතු ය.

(4) ස්වාභාවික ආපදාවක් වැනි හදිසි අවස්ථාවක දී හැරුණු කොට පාර්ලිමේන්තුවේ අවසරයකින් තොරව අමාත්‍යවරයා විසින් විභාගවලට නිශ්චය කරන ලද දින වෙනස් නොකළ යුතු ය.

(5) මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා විභාග කාල සීමාවන් සමඟ ගැටෙන පරිදි ඡන්ද විමසීම් සඳහා දින නියම නොකළ යුතු ය.

**ගුරුවරුන්.**

**10.** (1) සේවයට බඳවා ගනු ලබන ගුරුවරුන් **9 වැනි උපලේඛනයේ** III **වැනි පරිශිෂ්ඨයේ** 4 වැනි අයිතමයේ ලේඛණගත කොට තිබෙන ශික්ෂණ සුදුසුකම් ලබා තිබිය යුතු ය. වෙනත් ඕනෑම තෝරා ගැනීමක් / බඳවා ගැනීමක් සිදු කළ යුත්තේ III වැනි පරිශිෂ්ඨයේ 5 වැනි අයිතමයේ විස්තර කර තිබෙන බඳවා ගැනීමේ පරීක්ෂණ පදනම් කර ගනිමිනි.

(2) විදුහල්පතිවරුන් හා ගුරුවරුන් සඳහා වූ උසස්වීමේ පටිපාටිය මුළුමනින් ම කුසලතාව හා ජ්‍යෙෂ්ඨත්වය මත පදනම් විය යුතු ය.

ගුරුවරුන්ගේ කාර්යයන් සහ දුක් ගැනවිලි සඳහා සහන.

11. (1) සෑම ගුරුවරයකු ම පහත සඳහන් කාර්යයන් ඉටුකළ යුතු ය. එනම්:—

(අ) පාසලට පැමිණීමේ විධිමත් බව හා කාලානුගතිකත්වය පවත්වා ගැනීම;

(ආ) 29 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව විෂය මාලාව පවත්වා ගෙන යෑම හා සම්පූර්ණ කිරීම;

(ඇ) නියමිත කාලසීමාව ඇතුළත සම්පූර්ණ විෂය මාලාව අවසන් කිරීම;

(ඈ) එක් එක් ශිෂ්‍යයාගේ ඉගෙන ගැනීමේ හැකියාව තක්සේරු කොට, ඒ අනුව අවශ්‍ය නම් අතිරේක උපදෙස් ලබාදීමට පියවර ගැනීම;

(ඉ) දෙමව්පියන් හා භාරකරුවන් සමඟ ක්‍රමානුකූල ලෙස රැස්වීම් පවත්වා ශිෂ්‍යයා පාලසට පැමිණීමේ විධිමත් බවත්, ඉගෙන ගැනීමට ඇති හැකියාවත්, ඉගෙන ගැනීමේ දී දක්වන ලද ප්‍රගතියත්, වෙනත් අදාළ තොරතුරුත් පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම; සහ

(ඊ) නියම කරනු ලබන අන්දමේ වෙනත් කාර්යයන් ඉටු කිරීම.

(2) (1) වැනි උපවගන්තියේ නියමිත කාර්යයන් ඉටුකිරීම පැහැර හරින ගුරුවරයකු ඔහු හෝ ඇය වෙනුවෙන් බලපැවැත්වෙන සේවා රීති යටතේ විනය ක්‍රියා මාර්ගයකට ලක් විය යුතු ය.

කෙසේ වෙතත්, එවැනි විනය ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමට කලින් ඒ පිළිබඳව අදාළ ගුරුවරයාගේ අදහස් ප්‍රකාශ කිරීමට සාධාරණ අවස්ථාවක් සලසා දිය යුතු ය.

(2) ගුරුවරයකුට මුහුණපෑමට තිබෙන දුක්ගැනවිල්ලක් ඇත්නම් ඊට සහන සැලසිය යුත්තේ නියම කර ගන්නා ලද ආකාරයකිනි.

*ගුරු ශිෂ්‍ය අනුපාතය*

**12.** (1) මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයේ සිට වර්ෂයක් ඇතුළත සෑම පාසලකම නියමිත ගුරු ශිෂ්‍ය අනුපාතය පවත්වාගෙන යනු ලබන බවට යෝග්‍ය බලධාරියා විසින් තහවුරු කළ යුතු ය.

(2) පාසලකට පත් කරනු ලැබූ කිසිම ගුරුවරයකු (1) වැනි උපවගන්තිය යටතේ සඳහන් ගුරු ශිෂ්‍ය අනුපාතය පවත්වාගෙන යාමේ අරමුණ වෙනුවෙන් වෙනත් පාසලක හෝ කාර්යාලයක හෝ 13 වැනි වගන්තියේ නිශ්චිතව සඳහන් කර තිබෙන කරුණු හැරුණුකොට වෙනත් කිසිම අධ්‍යාපනික නොවන අරමුණු සඳහා හෝ සේවය කිරීමට සැලැස්විය යුතු නොවේ.

(3) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ගුරුවරුන් සේවයේ යෙදවීම පිළිබඳව ප්‍රමුඛත්වය දෙනු ලැබේ. පළාතේ සියලු ම පාසල්වලට අදාළ ගුරු ශිෂ්‍ය අනුපාතය පවත්වා ගෙන යනු ලබන්නේ නම් මිස කිසිම ගුරුවරයකු පළාතෙන් පිටත පාසලකට මාරුකර නොයැවිය යුතු ය.

*අධ්‍යාපනික නොවන අරමුණු වෙනුවෙන් ගුරුවරුන් සේවයේ යෙදවීම තහනම් කිරීම.*

**13.** දශවාර්ෂික සංගණනය, ආපදා සහන කාර්යයන් හෝ ඡන්ද විමසීම්වලට සම්බන්ධ කාර්යයන් හැරුණු කොට වෙනත් කිසිදු අධ්‍යාපනික නොවන අරමුණක් වෙනුවෙන් කිසිම ගුරුවරයකු සේවයේ නොයෙදවිය යුතු ය.

## දරුවන්ගේ අයිතිවාසිකම් සුරැකීම

*දුක්ගැනවිලිවලට සහනය සැලසීම.*

**14.** (1) යෝග්‍ය බලධාරියා 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ විධිවිධාන පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කළ යුතු ය.

(2) (1) වැනි උපවගන්තිය යටතේ පැමිණිල්ලක් ලැබුණු පසු අදාළ පාර්ශවවල අදහස ප්‍රකාශ කිරීමට සාධාරණ අවස්ථාවක් ලබා දීමෙන් අනතුරුව සභාව මාස තුනක කාල පරිච්ඡේදයක් ඇතුළත අදාළ කාරණය පිළිබඳ තීරණය කළ යුතු ය.

(3) එක් එක් පළාතේ උපදේශක සභාව දුක්ගැනවිලිවලට සහනය සැලසීම පිළිබඳ තීරණය අදාළ යෝග්‍ය බලධාරියාට ඉදිරිපත් කළ යුතු ය.

(4) යෝග්‍ය බලධාරියාගේ තීරණයෙන් අතෘප්තියට පත්වන ඕනෑම පුද්ගලයකුට පළාතේ මහාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

ජාතික උපදේශක සභාවේ සංයුතිය.

**15.** එක් එක් පළාත සඳහා සාමාජිකයන් 15 දෙනකුගෙන් සමන්විත උපදේශක සභාවක් ස්ථාපනය කළ යුතු අතර ඉන් සාමාජිකයන් හත් දෙනකු ජාතික ළමා ආරක්ෂක අධිකාරිය නියෝජනය කළ යුතු ය. මේ අතර තවත් සාමාජිකයන් 07 දෙනකු පළාත් විධායකයෙන් පත් කරනු ලැබිය යුතු වේ. ඇමතිවරයා විසින් සභාවේ සභාපතිවරයා පත් කළ යුතු ය.

පළාත් උපදේශක සභාවේ සංයුතිය.

**16.** (1) උපදේශක සභාවේ කෘත්‍යයන් පහත දැක්වෙන පරිදි විය යුතු ය:—

(අ) (i) නිදහස් පාසල් අධ්‍යාපනය ලබා ගැනීමේ විශ්වීය හා සමාන ප්‍රවේශයට අදාළ දරුවාගේ අයිතිවාසිකම තහවුරු කිරීම පිණිසත්;

(ii) භෞතික, මානසික, සදාචාරාත්මක, ආගමික හා සමාජයීය වශයෙන් ළමයින් පූර්ණ සංවර්ධනයක් ලබා ගන්නා බව තහවුරු කිරීම පිණිස ඔවුන්ගේ ලැදිකම් ප්‍රවර්ධනය කිරීමත් ඔවුන් උපයෝජනයෙන් හා ප්‍රචාරණයෙන් වළක්වා ගැනීම පිණිසත්;

(iii) පාසල් අධ්‍යාපනය ලබා ගැනීමේ විශ්වීය හා සමාන ප්‍රවේශයට අදාළ දරුවන්ගේ හා ශිෂ්‍යයන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම පිණිසත්;

ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව පළාත් විධායකයට උපදෙස් දීම.

(ආ) (16) (1) (අ) වන වගන්තියෙහි විධිවිධාන පළාත තුළ ක්‍රියාත්මක කිරීම පිළිබඳව ජාතික ළමා ආරක්ෂක අධිකාරියට වාර්තා ඉදිරිපත් කිරීම;

(ඇ) අදාළ පැමිණිලි විමර්ශනය කොට 14 වන වගන්තිය යටතේ සැලසිය හැකි සහන නිර්දේශ කිරීම.

(2) 7 වන වගන්තිය යටතේ සභාව ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය සියලු ම විධිවිධාන අමාත්‍යවරයා විසින් සැලසිය යුතු අතර, ඊට සභාවේ බලතල ද ක්‍රියා පටිපාටි ද ඇතුළත් විය යුතු ය.

(3) උපදේශක සභාවේ සාමාජිකයන්ගේ දීමනා සහ පත්කිරීමේ කොන්දේසි සහ අවශ්‍යතා අදාළ යෝග්‍ය බලධාරියා විසින් නියම කරනු ලබන පරිදි විය යුතු ය.

අර්ථ නිරූපණය.

**17.** මේ පනතේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස :—

(අ) "යෝග්‍ය බලධාරියා" යන්නෙන්—

(i) රජයේ පාලනය යටතේ පවතින රජයේ පාසලක් සම්බන්ධයෙන් "රජයද";

(ii) උපවගන්ති (i) හි සඳහන් පාසල හැරුණු කොට රජයේ වෙනත් පාසලක් සම්බන්ධයෙන් "පළාත් විධායකය" විසින් පාලනය කරනු ලබන රජයේ පාසලක් ද,

අදහස් වෙයි.

(ආ) "දරුවා" යන්නෙන් පාසලට ඇතුළත්වීමේ වර්ෂයෙහි ජනවාරි 31 වැනි දිනට වයස අවුරුදු පහක් වූ දරුවකු අදහස් වෙයි;

(ඇ) දරුවකු සම්බන්ධයෙන් "භාරකාරයා" යන්නෙන් එම දරුවාගේ ආරක්ෂණය හා භාරය සතුව පවතින තැනැත්තා අදහස් වන අතර, ඊට ස්වාභාවික භාරකාරයා හෝ උසාවියකින් හෝ ව්‍යවස්ථාවකින් හෝ පත්කරනු ලැබූ හෝ ප්‍රකාශයට පත්කරනු ලැබූ හෝ භාරකාරයකු ද අයත් වේ;

(ඈ) "අමාත්‍යවරයා" යන්නෙන් අදාළ පරිදි යෝග්‍ය අධිකාරියෙහි අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා අදහස්වේ;

(ඉ) “නියමිත” යන්නෙන් මේ පනත යටතේ පනවන ලද නියෝග මගින් නියම කරනු ලැබූ යන්න අදහස් වේ;

(ඊ) “නියමිත පාසල්” යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වැනි උපලේඛනයේ I වැනි ලැයිස්තුවේ 3 වැනි අයිතමයට අනුකූලව රජය යටතට පැවරෙන රජයේ පාසල් අදහස් වේ;

(උ) “පළාත් විධායකය” යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඊ) ව්‍යවස්ථාව යටතේ එක් එක් පළාත සඳහා ක්‍රියාත්මක වන පළාත් අමාත්‍ය මණ්ඩලය හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඕ) ව්‍යවස්ථාව යටතේ බලතල ක්‍රියාත්මක කරන ජනාධිපතිවරයා, ආණ්ඩුකාරවරයා හෝ වෙනත් ඕනෑම පුද්ගලයකු අදහස් වේ;

(ඌ) “උපලේඛනය” යන්නෙන් මේ පනතට අමුණා ඇති උපලේඛනය අදහස් වේ;

(එ) “පාසල් අධ්‍යාපනය” යන්නෙන් ඕනෑම ප්‍රසිද්ධ විභාගයකට යටත් ව පළමුවැනි ශ්‍රේණියේ පටන් දහතුන්වන ශ්‍රේණිය දක්වා ලබාදෙන අධ්‍යාපනය අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

18. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

උප ලේඛනය

1. අධ්‍යාපනය ලැබීම සඳහා දරුවාට ඇති අයිතිවාසිකම යෝග්‍ය බලධාරියා පිළිගනු ලබන අතර, අනුක්‍රමයෙන් මෙන්ම සමාන අවස්ථාවන් ලබාදීමේ පදනමින් මේ අයිතිවාසිකම සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් බලධාරියා පහත සඳහන් කරුණු විශේෂයෙන් ම ඉටු කරනු ඇත. එනම්:—

(අ) මූලික අධ්‍යාපනය සියලු දෙනාට ම නොමිලේ ලබාගැනීමට අවස්ථාවක් උදාකිරීම ;

(ආ) සාමාන්‍ය සහ වෘත්තීය අධ්‍යාපනය ඇතුළු ද්විතියක අධ්‍යාපනයේ විවිධාකාර අංශ සංවර්ධනය කිරීම දිරිගැන්වීමත්, සෑම දරුවකු ම ඒවා ලබා ගැනීමට හා ඊට ප්‍රවේශ වීමට අවස්ථාව ලබාදීමත් නිදහස් අධ්‍යාපනය හඳුන්වා දීම සහ අවශ්‍යතා පරිදි මූල්‍ය සහාය ලබාදීම වැනි යෝග්‍ය පියවර ගැනීම ;

(ඇ) සියලු ම දරුවන්ට අධ්‍යාපනික හා වෘත්තීය තොරතුරු හා මාර්ගෝපදේශ ලබාගැනීමට අවස්ථාවක් සැලසීම හා ඊට ප්‍රවේශය ලබාදීම ;

(ඈ) පාසල්වලට පැමිණීම විධිමත් කිරීමට දිරිගැන්වීමේ පියවර ගැනීම හා පාසල් හැර යන්නන්ගේ සංඛ්‍යාව පාලනය කිරීම.

2. පාසල් විනය දරුවාගේ මානව අභිමානයට අනුගත අන්දමටත් වත්මන් සම්මුතියට අනුකූල ලෙසත් ක්‍රියාත්මක කරන බව සහතික කිරීමට අවශ්‍ය සියලුම යෝග්‍ය පියවර යෝග්‍ය බලධාරියා විසින් ගනු ලැබිය යුතු ය.

3. විශේෂයෙන් ම ලෝක ව්‍යාප්ත අවිද්‍යාව හා නිරක්ෂරතාව මුලිනුපුටා දැමීමට දායකවීමේ අරමුණින් හා විද්‍යාත්මක හා තාක්ෂණික දැනුමට සහ නවීන ඉගැන්වීමේ උපක්‍රමවලට ප්‍රවේශය ලබාගැනීම පහසු කරවීම පිණිස අධ්‍යාපනයට අදාළ කරුණුවල දී ජාත්‍යන්තර සහයෝගය ප්‍රවර්ධනය කොට දිරිගැන්වීමට යෝග්‍ය බලධාරියා පියවර ගත යුතු ය.

4. අත්පත් කරගත හැකි ඉහළම මට්ටමේ සෞඛ්‍ය තත්ත්වයක් ද රෝග සුවකර ගැනීම සඳහාත් සෞඛ්‍යය පුනරුත්ථාපනය කරගැනීම සඳහාත් ලබාදෙන පහසුකම් භුක්ති විඳීමටත් දරුවකුට ඇති අයිතිවාසිකමත් යෝග්‍ය බලධාරියා විසින් පිළිගනු ලබයි. එවැනි සෞඛ්‍ය ආරක්ෂණ සේවාවන්ට ප්‍රවේශය ලබාගැනීමට දරුවන්ට හිමි අයිතිවාසිකම පැහැර නොහරින බව තහවුරු කිරීමට රජයේ පාර්ශ්ව ප්‍රයන්ත දැරිය යුතු ය.

5. යෝග්‍ය බලධාරියා විසින් අදාළ ජාත්‍යන්තර ගිවිසුම්වල සඳහන් පරිදි දරුවන් මාදක ඖෂධ සහ චිත්තවර්තන ද්‍රව්‍යයන් නීතිවිරෝධී ලෙස භාවිත කිරීමෙන් ආරක්ෂා කිරීමටත් එවැනි ද්‍රව්‍ය නීති විරෝධී ලෙස නිෂ්පාදනය කිරීමේ හා විකිණීමේ කටයුතුවලට දරුවන් භාවිත කිරීම වැලැක්වීමටත් ගතයුතු ව්‍යවස්ථාදායක, පරිපාලන, සාමාජීය සහ අධ්‍යාපනික පියවර ඇතුළු සියලුම යෝග්‍ය පියවර ගත යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.